සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර පරීක්ෂණය 2019

## පෙරදිග සංගීතය

8 ශ්‍රේණිය

කාලය පැය 2 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියලුම ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 සරිගපධස් යන ආරෝහණ ස්වර අයත් වන්නේ,

(i) බිලාවල් රාගයට ය. (ii) කාෆි රාගයට ය.

(iii) භූපාලි රාගයට ය. (iv) භෛරවී රාගයට ය.

02 භූපාලි රාගාශ්‍රිතව නිර්මාණය වූ ස්වරස්ථාපන ගීයක් වන්නේ,

(i) හෝ හෝ ගා රැල්ල බිඳෙනවා (ii) සිරි සාර අති ශාන්ත

(iii) සිරස නමමු මව් පොළොවට (iv) ඇහැල මහට ඇහැල ගහක

03 මාත්‍රා 3/4 බැගින් බෙදෙන හින්දුස්ථානී තාල පදය වන්නේ,

(i) දීප්චන්දි තාලය (ii) ත්‍රිතාලය (iii) ධාදරා තාලය (iv) ලාවනී තාලය

04 ප්‍රධාන තත් හතරක් සහිත බෙංගාල ප්‍රදේශයේ ප්‍රචලිත සංගීත භාණ්ඩයකි

(i) වීණාව (ii) වයලීනය (iii) එස්රාජය (iv) සිතාරය

05 මනමේ, සිංහබාහු යන නාට්‍ය නිර්මාණකරු වන්නේ,

(i) වික්ටර් වික්‍රමගේ මහතා ය. (ii) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

(iii) සයිමන් නවගත්තේගම මහතා ය. (iv) හෙන්රි ජයසේන මහතා ය.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යා කරන්න.

| | | | |
|---|---|---|---|
| 06 | Interlude | * | බෝ දොස් කියා මාගේ බෝ දොස් කියා |
| 07 | දෙවියන්ගේ ගුණ වර්ණනා කරන ගී | * | සිතාරය |
| 08 | නූර්ති ගීයකි | * | අතුරු වාදනය |
| 09 | උතුරු ඉන්දියානු ප්‍රධාන තත් වාද්‍ය භාණ්ඩයකි | * | ජප් තාලය |
| 10 | මාත්‍රා 2/3 වශයෙන් යෙදෙන තාල පදයකි | * | භජන් ගී |

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

11 මුඛ පරම්පරාවෙන් පැවතගෙන එන ගී විශේෂයකි

(i) සරල ගී (ii) ප්‍රශස්ති ගී (iii) ගැමි ගී (iv) නාට්‍ය ගී

12 තාලයක ඇති කුඩාම ඒකකය වන්නේ,

(i) මාත්‍රාවයි. (ii) විභාගයයි. (iii) ඨේකාවයි. (iv) ආවර්තයයි.

13 ''හිරු දෙවියෝ වැඩිය තැනේ'' මෙම ගීය

(i) දෑල් ගීයකි. (ii) කමත් ගීයකි. (iii) කෙළි ගීයකි. (iv) මේ කිසිවක් නොවේ.

14 බටහිර සංගීතයේ ඇති 𝅗𝅥 සංකේතය හඳුන්වන්නේ,

(i) ක්වේවර් නමිනි. (ii) සෙමි බ්‍රිව් නමිනි.

(iii) ක්‍රොචෙට් නමිනි. (iv) මිනිම් නමිනි.

15 ''පිතු සෙනෙහේ පිදු පියෙකු නොමැති ලොව'' ගීතය

(i) කිතුණු බැති ගීයකි. (ii) නූර්ති ගීයකි.

(iii) මව්පිය ගුණ වරුණ ගීයකි. (iv) නව නාට්‍ය ගීයකි.

- **පහත අංක 16 සිට 20 දක්වා ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

16 නාඩගම් ගීත සඳහා යොදාගන්නා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වන්නේ මද්දලයයි. ( )

17 ''මූදු පතුල යට ඉඳලා'' මව්පිය ගුණ ගීයකි. ( )

18 ''අනුප් ජලෝටා'' ප්‍රසිද්ධ භජන් ගායකයෙකි. ( )

19 රවීන්ද්‍රනාත් තාගෝර් තුමා ශාන්ති නිකේතනයේ නිර්මාතෘවරයායි. ( )

20 ''චින්න චින ආසෙ'' යන ගීය රෝජා චිත්‍රපටයේ එන ගීයක් නොවේ. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) ඔබ උගත් භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

(ii) එම ගීය ගායනා වන තාලය කුමක් ද? (ලකුණු 02)

(iii) තාලයක විභාගයක් සෑදී ඇත්තේ කෙසේ ද? (ලකුණු 02)

02 (i) සරල ගීතයක අඩංගු වන කොටස් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(ii) එයින් ඔබ කැමති අංග දෙකක් විස්තර කරන්න. (ලකුණු 06)

03 (i) ගැමි ගීවල ඇති සුවිශේෂී ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 04)

(ii) පහත සඳහන් මාතෘකා අතුරින් ඔබ කැමති මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. ගොයම් ගී 2. නෙළුම් ගී

3. භජන් ගී 4. කමත් ගී (ලකුණු 06)

04 (i) භාරතයෙන් අප රටට ලැබුණු නාට්‍ය වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) එම නාට්‍ය වර්ග සඳහා යොදාගන්නා සංගීත සම්ප්‍රදායන් දෙක වෙන් වෙන්ව ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) එම නාට්‍ය ශෛලීන් දෙකෙන් එකකට අයත් ගීයක ස්ථායි කොටසක් ලියන්න. (ලකුණු 04)

05 (i) ''කොබෝ කුරුලුවනේ'' මෙම ගී පාදයේ අකුරුවලට හිමි මාත්‍රා සංඛ්‍යාව කීයද? (ලකුණු 04)

(ii) ඉහත ගී පාදය ගැයීමේ දී හිමිවන මාත්‍රා (ගීමත්) සංඛ්‍යාව නම් කරන්න. (ලකුණු 02)

(iii) එම ගී පාදය ගායනය කරන ආකාරය අනුව පද ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | iii | (02) | iv | (03) | i | (04) | iii | (05) | ii |
| (06) | අතුරු වාදනය | (07) | භජන් ගී | (08) | බෝ දොස් කියා මාගෙ | | | (09) | සිතාරය |
| (10) | ජප් තාලය | (11) | iii | (12) | i | (13) | ii | (14) | iv |
| (15) | iii (16) ✓ | (17) | × | (18) | ✓ | (19) | ✓ | (20) | × |

(1 x 20 = 20)

## II කොටස

01 (i) ස්වරස්ථාපන ගීයක ස්ථායි කොටස ගීත ස්වර ප්‍රස්ථාර කිරීම සඳහා ලකුණු 6 ක් ලබාදෙන්න.

(ii) අදාළ තාලය සඳහා ලකුණු 2 ක් ලබාදෙන්න.

(iii) මාත්‍රා කිහිපයක් එක්වීමෙන් විභාගයක් සෑදෙන බව දක්වා ඇත්නම් ලකුණු 2 ක් ලබාදෙන්න.

02 (i) තනුව (Melody), පෙරවාදනය (Intro / Introduction), ස්ථායි කොටස (Song), අතුරු වාදනය (Interlude), අන්තරා කොටස (Verse), බිට්ස් (Bits), කවුන්ටර් (Counter)
එක් කොටසකට 1 ලකුණ බැගින් ලබාදෙන්න.

(ii) ලියා ඇති කොටසට අදාලව නිවැරදි තොරතුරු සලකා බලා එක් අංගයකට උපරිම ලකුණු 3 බැගින් ලබාදෙන්න.

03 (i) එක් ලක්ෂණයකට ලකුණු එක බැගින් ලබාදෙන්න.

(ii) ලියා ඇති මාතෘකාවෙහි නිවැරදි තොරතුරු සලකා බලා එක් අංගයකට උපරිම ලකුණු 3 බැගින් ලබාදෙන්න.

04 (i) නූර්ති සහ නාඩගම්

(ii) නූර්ති - හින්දුස්ථානී සංගීත සම්ප්‍රධාය
නාඩගම් - කර්ණාටක සංගීත සම්ප්‍රධාය

(iii) ලියා ඇති ගීතයේ ස්ථායි කොටස පිළිබඳව සලකා බලා උපරිම ලකුණු 4 ක් ලබාදිය හැකිය.

05 (i) 9 කි.

(ii) 12 කි.

(iii) කො බෝ - / කු රු ලු / ව නේ - / - - -

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

8 ශ්‍රේණිය

# පෙරදිග සංගීතය

## ප්‍රායෝගික පරීක්ෂණය

(01) භූපාලි රාගාශ්‍රිත ස්වරස්ථාපන ගීයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10 යි.)

(02) ඔබ උගත් නූර්ති හෝ නාඩගම් ගීයක් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10 යි.)

(03) ජප් තාලය හෝ දීප්චන්දි තාලය අතින් තාල තබන්න. (ලකුණු 10 යි.)

(04) ගොයම්, නෙළුම්, කමත් ගී අතුරින් ඔබ කැමති ගීයක් ගායනය කරන්න. (ලකුණු 10 යි.)

(05) ඔබ කැමති ගීයක් ස්වර පුවරු භාණ්ඩයකින් ගායනය / වාදනය කරන්න. (ලකුණු 10 යි.)